**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2022**
**-----------------------------------------------------**

**පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරණ ණය ගිවිසුමේ 01 වගන්තිය හි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර, සබරගමුව, නැගෙනහිර, දකුණ, වයඹ, මධ්‍යම සහ උතුරු පළාත් වල මගී සහ භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම වර්ධනය වීමට මුහුණ දීම සඳහා සහ වාහන මෙහෙයුම් සහ මාර්ග නඩත්තු වියදම්, ප්‍රවාහන කාලය සහ අනතුරු අවම කිරීම මගින් අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායක වීම සඳහා පදික උරහිස් සහිත මංතීරු දෙකකින් සමන්විත පාලම් 25 ක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැකේජය 01, 02 සහ 03 යන සංරචක තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 4,632 කට සමාන එ.ජ.ඩො. මිලියන 35.41 ක් වන අතර අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 සැප්තැම්බර් 07 දින ආරම්භ කළ අතර 2017 සැප්තැම්බර් 05 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය මුලින් 2019 දෙසැම්බර් 31 දින දක්වාත් පසුව 2023 දෙසැම්බර් 31 දක්වාත් දීර්ඝ කර තිබුණි.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

**මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 5 හි 43 (අ) වගන්තියට අනුව එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසන් දිනට පැවති විදේශ විනිමය අනුපාතයට ගැලපිය යුතු වුවත් ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | 3,772 | විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම වසර අවසානයේ සිදු කර නොතිබුණු අතර අනාගත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගැනීමට සටහන් කරගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 39 ඡේදයට අනුව, විදේශ විනිමය අනුපාත වෙනස්වීම් හේතුවෙන් ඇති වන ලාභ හෝ අලාභ මුදල් ප්‍රවාහයක් නොවන අතර ආරම්භක සහ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ ශේෂයන් සංසන්දනය කිරීමේදී අදාළ බලපෑම සටහන් කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයට අදාළ රු. මිලියන 4 ක් වූ විනිමය වෙනස්කම් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ගලා ඒම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | 4 | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් 2022 අප්‍රේල් 22 දින රු. මිලියන 63 ක ලාභ අහිමිවීම ඇතුළුව රු. මිලියන 151 ක් ඉල්ලුම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 100 වගන්තියට අනුව අසම්භාව්‍ය වගකීම් පිළිබඳ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණයකර නොතිබුණි. | 63 | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේදී ගිවිසුමක් හෝ අනුමැතියකින් තොරව රු. මිලියන 10 ක මුදලක් ප්‍රධාන පාලම් ඉදිකිරීම් (MBC) ව්‍යාපෘතියට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී ඇවර කර තිබුණු අතර එම ශේෂය සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස තවදුරටත් පෙන්වා තිබුණි. | 10 | 2020 වසර වන විට ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය වසා දමා තිබුණු අතර එම නිසා මෙම මුදල ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙන් අයකර ගැනීමට නොහැකි විය. | නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනයේ සටහන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2018 වර්ෂයේදී කිසිදු ලිඛිත ගිවිසුමකින් තොරව ව්‍යාපෘතිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු. මිලියන 2 ක මුදලක් ලබාගෙන තිබුණි. එය 2021 වර්ෂය අවසන් වන විට රජයේ දායකත්වය තුළ සටහන්කර තිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශන වලින් එම අගය කපා හැර තිබුණි. | 2 | ඉඩම් අත්පත් කර ගැනීමේ ගෙවීම් පියවීමට ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම ප්‍රධාන ගැටලුවක් විය. එබැවින් එම ගෙවීම් පියවීමට මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු. මිලියන 1.95 ක් ලබාගෙන තිබුණි. | නිසි අනුමැතිය සහිතව අරමුදල් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය. | සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම පවත්වා නොතිබුණි. | Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් අඩු කාර්ය මණ්ඩලයක් සේවයට වාර්තා කළ බැවින් මෙහෙයුම් කමිටු රැස්වීම් සැලසුම්කළ පරිදි පවත්වා නොතිබුණු අතර 2022 ජූනි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය නියෝජිතායතනය විසින් ණය මුදල අත්හිටුවා තිබුණි. | කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් වලට අනුගත විය යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු. මිලියන 252 ක අතුරු ගෙවීම් සහතික (IPC) දහහතරක් විදේශ ණය නියෝජිතායතනයට ඉදිරිපත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නියෝජිතායතනය විසින් එම මුදල ගෙවා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවලට අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පැවතුණි. | රු. මිලියන 169 ක් වූ අතුරු ගෙවීම් සහතික වටිනාකම කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම අරාබි ආර්ථික සංවර්ධන සඳහා වූ කුවේට් අරමුදල විසින් 2022 ජූනි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා තිබුණි. එබැවින්, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 14.8 වගන්තියට අනුව කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය හැක. | ණය මුදල් නිදහස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පැකේජ 03 අවසන්කළ යුතු සංශෝධිත දිනය | රු. මිලියන 74.9 ක අතුරු බිල්පත් | අඩුපාඩු නිවැරදි |

| | | |
|---|---|---|
| 2022 සැප්තැම්බර් 14 දින වුවද, එම කාල සීමාව තුළ වැඩ අවසන් කර නොතිබුණු අතර රු. මිලියන 1,440 ක අතුරු බිල්පත් නොගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් 2022 අගෝස්තු 31 දින වැඩ තාවකාලිකව අත්හිටුවා තිබුණි. කෙසේ වෙතත්, පැකේජය 03 හි භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 90 ක්ව පැවතුණි. තවද, අතුරු බිල්පත් සඳහා රු. මිලියන 202 ක් නොගෙවීම නිසා ගිවිසුමේ 6.6 වගන්තියට අනුව විදේශ උපදේශක වෙත ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය හැක. | නොගෙවීම හේතුවෙන් 2022 අගෝස්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් වැඩ අධීක්ෂණය උපදේශකවරයා විසින් අත්හිටුවා තිබුණි. පසුව ණය ගිවිසුමේ කොන්දේසි අනුව සේවායෝජක විසින් 2022 අගෝස්තු 31 දින සිට සිවිල් ඉදිකිරීම් කටයුතු අත්හිටුවන ලදී. | කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ණය ගිවිසුමේ දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 9 ක් ගතවී තිබුණද, කුවේට් ඩිනාර් (KWD) මිලියන 10 කට සමාන රු. මිලියන 4,632 ක් වූ සම්පූර්ණ ණය මුදලෙන් කුවේට් ඩිනාර් (KWD) මිලියන 6.66 කට සමාන රු. මිලියන 4,128 ක් පමණක් භාවිතා කර තිබුණි. | එකඟ වූ පාලම් ලැයිස්තුව සංශෝධනය කිරීම, දුර්වල කාර්යසාධනය හේතුවෙන් පැකේජය 1 හි විදේශීය උපදේශකගේ වැඩ අවසන් කිරීම, පැකේජ 1 හි කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය, පැකේජ 2 හි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම, COVID - 19 වසංගතය සහ 2022 ජුනි 08 දින සිට ණය නියෝජිතායතනය විසින් ණය නිදහස් කිරීම අත්හිටුවීම අරමුදල් උපයෝජනය ප්‍රමාද වීමට බලපා තිබුණි. | ණය මුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |